අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/09/12/08/10/III/2022 ඔබේ යොමුව / உமது இல. / Your Ref. දිනය / திகதி / Date 2022.12. 30

චක්‍රලේඛ අංක: 41/2022

සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය/සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම පාසල්වල විදුහල්පතිවරුන්,

## සුභග සිසුන් සඳහා ශිෂ්‍යත්ව වැඩසටහන

සුභග ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා සිසු සිසුවියන් තෝරාගැනීම සම්බන්ධයෙන් මෙයට පෙර නිකුත් කර ඇති 2020.12.15 දිනැති අංක 34/2020 දරණ චක්‍රලේඛය අභිබවා මෙම චක්‍රලේඛයේ උපදෙස් 2023 වර්ෂයේ දී හා ඉන් පසුව සුභග ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා සිසු සිසුවියන් තෝරාගැනීමේ දී බලපවත්වනු ඇත.

**01.** අනාගත අභියෝග ජය ගැනීම සඳහා අවශ්‍ය වන විභව්‍යතාවලින් යුත් නිර්මාණශීලී තරුණ පරපුරක් බිහිකරලීම උදෙසා විවිධ ක්ෂේත්‍රවලින් සුවිශේෂ කුසලතා දක්වන ලද පාසල් සිසුන්ගේ කුසලතා ජාතික මට්ටමෙන් ඇගයීමට ලක් කිරීමේ අරමුණ පෙරදැරි ව මෙම සුභග ශිෂ්‍යත්ව වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ.

**02. අරමුණු**

2.1 සුභග සිසුන්ගේ සුවිශේෂ කුසලතා සංවර්ධනය කරමින් පාසල් අධ්‍යාපන ඉලක්ක සපුරා ගැනීමට අවස්ථා ලබා දීම.

2.2 රටෙහි සංවර්ධනයට සුවිශේෂ දායකත්වයක් ලබා දිය හැකි වන පරිදි විවිධ ක්ෂේත්‍ර ඔස්සේ සුවිශේෂ දක්ෂතා දක්වන සිසුන්හට එම කුසලතා තව දුරටත් වැඩි දියුණු කර ගැනීම සඳහා දිරි ගැන්වීම.

**03. ශිෂ්‍යත්ව සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය මූලික සුදුසුකම්**

3.1 ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

3.2 අදාළ වර්ෂයේ දී රජයේ පාසලක අ.පො.ස(උ.පෙළ) හැදෑරීම සඳහා අවම සුදුසුකම් සහිත ව සමත් ව, දැනට අ.පො.ස. (උ.පෙළ) හැදෑරීම ආරම්භ කරන ලද 12වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන ශිෂ්‍යයකු/ ශිෂ්‍යාවක විය යුතු ය.

3.3 යහපත් චරිතයකින් යුක්ත ශිෂ්‍යයකු/ ශිෂ්‍යාවක විය යුතු ය.

3.4 අයදුම්කරු ඉල්ලුම් කරනු ලබන ක්ෂේත්‍රයට අදාළ ක්‍රියාකාරකම්වල අඛණ්ඩ ව නිරත විය යුතු ය.

**04. අයදුම්පත් ඉදිරිපත් කිරීම**

4.1 මේ සම්බන්ධ ව අදාළ අයදුම්පත්‍රයේ ආකෘතියට (ඇමුණුම් 01) අනුව සිසුන් විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත් පිටපත් දෙකකින් යුක්ත ව, අදාළ සහතිකවල පිටපත් ද සමඟ දැනට

අ.පො.ස. (උ.පෙළ) ඉගෙනුම ලබන පාසලේ විදුහල්පති වෙත යොමු කළ යුතු ය. අ.පො.ස. (උ.පෙළ) හැදෑරීම සඳහා වෙනත් පාසලකට ඇතුළත් වී සිටින සිසුන් තමා, අ.පො.ස (සා.පෙළ) හැදෑරූ පාසලේ විදුහල්පති නිර්දේශය ද සහිත ව අ.පො.ස. (උ.පෙළ) හදාරනු ලබන පාසලේ විදුහල්පති වෙත අයදුම්පත් බාර දිය යුතු ය.

4.2 මෙම ශිෂ්‍යත්වය ඉල්ලුම් කිරීමේ අයදුම්පත්‍රය (ඇමුණුම 01) හා ඊට අදාළ උපදෙස් පාසලේ දැන්වීම් පුවරුවේ ප්‍රදර්ශනය කිරීමට විදුහල්පතිවරුන් වග බලා ගත යුතු ය.

4.3 නියමිත දිනට පසු ව පාසලට ලැබෙන අයදුම්පත් හා අදාළ අයදුම්පතෙහි සඳහන් සුදුසුකම් සනාථ කිරීමට අවශ්‍ය සහතිකවල පිටපත් නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4.4 මෙම ශිෂ්‍යත්ව ප්‍රදානය පහත සඳහන් පරිදි විශේෂ කාණ්ඩ 3ක් ප්‍රධාන කොට සිදු කෙරේ.

I. කාණ් ඩ අංක 01- නව නිපැයුම් සඳහා ලබා ගත් ජයග්‍රහණ

II. කාණ්ඩ අංක 02 - සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ

III. කාණ්ඩ අංක 03 - ක්‍රීඩා සඳහා ලබා ගත් ජයග්‍රහණ

කාණ්ඩ කිහිපයකින් ඉල්ලුම් කරන්නේ නම් එක් එක් කාණ්ඩය යටතේ වෙන් වෙන් වශයෙන් ඉල්ලුම් කළ යුතු ය.

4.5 ඉහත 03 ඡේදයට අනුව මූලික සුදුසුකම් සපුරාලන ශිෂ්‍යයකුට/ශිෂ්‍යාවකට තම සුවිශේෂ දක්ෂතා මත 4.4 හි සඳහන් ඕනෑ ම කාණ්ඩයක් යටතේ ඉල්ලුම් පත්‍ර යොමු කළ හැකි ය.

## 05. තෝරා ගැනීමේ ක්‍රමවේදය

මෙම චක්‍රලේඛයේ 06 කොටසේ සඳහන් ලකුණු පටිපාටියට අනුකූලව පහත සඳහන් ක්‍රමවේදය අනුගමනය කරමින්, එක් එක් මට්ටමේ දී අයදුම්පත් හා සහතික මැනවින් පරීක්ෂා කර අයදුම්පතෙහි පිටපත් දෙකෙහි ම අදාළ තීරුවේ ලකුණු සටහන් කළ යුතු ය.

5.1 පාසල් මට්ටම

I. පාසලට ලැබෙන අයදුම්පත් සියල්ලෙහිම මූලික තොරතුරු ලේඛනගත කර පවත්වා ගත යුතුය (සී.ආර් පොතක හා/හෝ පරිගණකගත කර).

II. විදුහල්පතිගේ සභාපතිත්වයෙන් හා ජ්‍යෙෂ්ඨ ගුරුවරුන් දෙදෙනෙකුගේ සාමාජිකත්වයෙන් යුත් (තිදෙනකුගෙන් සමන්විත) පාසල් තේරීම් කමිටුවක් විසින් අයදුම්පත් පරීක්ෂා කර ප්‍රදානය කරන ලකුණු, අයදුම්පතෙහි ලකුණු තීරුව 01හි සඳහන් කළ යුතු ය.

III. පාසලට ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව 150කට වඩා සැලකිය යුතු සංඛ්‍යාවක් ඉක්ම වූ අවස්ථාවකදී පමණක් අයදුම්පත් පරීක්ෂා කිරීමේ කඩිනම් බව, නිරවද්‍ය බව හා පහසුව සලකා සුදුසු පරිදි නියෝජ්‍ය/ සහකාර විදුහල්පතිවරයෙකු හෝ අංශ ප්‍රධානි/ ශ්‍රේණි ප්‍රධානි ගුරුවරයෙකුගේ සභාපතිත්වයෙන් යුතු පාසල් තේරීම් කමිටු එකකට වඩා පත්කර ගත හැකිය. එසේ වුව ද කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත තෝරා ගත් සිසුන්ගේ

නාම ලේඛන යොමු කිරීමේ දී විදුහල්පති විසින් අදාළ කමිටු මඟින් තෝරා ගත් ශිෂ්‍ය නාම ලේඛනවල නිරවද්‍ය බව සහතික කළ යුතු ය.

IV. ඒ ඒ කාණ්ඩය යටතේ එක් එක් ශිෂ්‍යයා/ශිෂ්‍යාවගේ සුදුසුකම් සනාථ කර ගැනීමෙන් අනතුරුව සහතිකවල මුල් පිටපත් පරික්ෂාකර චක්‍රලේඛානුකූලව සුදුසුකම් සපුරා ඇති සියළුම අයදුම්කරුවන්ගේ නාම ලේඛන එක් එක් කාණ්ඩය යටතේ වෙන් වෙන් වශයෙන් ඇමුණුම 02(A) ආකෘතියට අනුකූල ව මුළු ලකුණු අවරෝහණ අනුපිළිවෙලට සකස් කළ යුතු ය. එම ආකෘතිය (දෘඪ හා මෘදු පිටපත්) සමඟ අයදුම්කරුවන්ගේ අයදුම්පත් හා සහතිකවල පිටපත් අනුපිළිවෙලින් සකස් කර විදුහල්පති විසින් සහතික කර එක් අයදුම්පතක් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතු ය. එහි අනෙක් පිටපත පාසලේ සුරක්ෂිත ව තබා ගත යුතු ය.

5.2 කලාප මට්ටම

I. කලාප මට්ටමේදී සුහග ශිෂ්‍යත්ව වැඩසටහන සම්බන්ධීකරණය සඳහා මාණ්ඩලික නිලධාරියෙකු පත්කිරීමට කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් කටයුතු කළ යුතුය.

II. මෙම චක්‍රලේඛයේ ඇමුණුම 02 (A) ආකෘතිය සමඟ ඒ ඒ පාසලෙන් ලැබෙන අයදුම්පත් හා අදාළ සහතික/ ලේඛන ද ඉහත සඳහන් සම්බන්ධීකරණ නිලධාරියාගේ සම්බන්ධීකරණයෙන් පහත පරිදි පරීක්ෂා කළ යුතු ය.

III. කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අධීක්ෂණයෙන්, ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියකුගේ සභාපතිත්වයෙන් හා තවත් මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙකුගේ සාමාජිකත්වයෙන් යුත් (තිදෙනකුගෙන් සමන්විත) සමාන්තර කලාප තේරීම් කමිටු පිහිටවිය යුතුය. චක්‍රලේඛය අනුව ප්‍රදානය කරන ලකුණු අයදුම්පතෙහි ලකුණු තීරුව 02හි සඳහන් කළ යුතු ය.

IV. කලාප අධ්‍යාපන කාර්යාලයට ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව 150කට වඩා සැලකිය යුතු සංඛ්‍යාවක් ඉක්මවූ අවස්ථාවකදී පමණක් ශිෂ්‍යත්වලාභීන් තේරීමේ කඩිනම් බව, නිරවද්‍ය බව හා පහසුව සලකා සුදුසු පරිදි කලාප තේරීම් කමිටු එකකට වඩා පත්කර ගත හැකි ය. එසේ වුව ද පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත තෝරා ගත් සිසුන්ගේ නාම ලේඛන යොමු කිරීමේ දී කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අදාළ කමිටු මඟින් තෝරා ගත් ශිෂ්‍ය නාම ලේඛනවල නිරවද්‍ය බව සහතික කළ යුතු ය.

V. මෙහි දී සහතිකපත් පරික්ෂා කිරීමෙන් අනතුරුව කලාප තේරීම් කමිටුව විසින් ලබා දෙනු ලබන ලකුණු හා පාසල් තේරීම් කමිටුව විසින් ලබා දී ඇති ලකුණුවල යම්

වෙනසක් ඇත්නම් කලාප තේරීම් කමිටුව මඟින් ලබා දෙන ලකුණු නිරවද්‍ය ලෙස පිළිගනු ලැබේ.

VI. එක් එක් කාණ්ඩය යටතේ ලකුණු 15 හෝ ඊට වැඩි ලකුණු ලබා ගන්නා ලද තෝරා ගත් අයදුම්කරුවන්ගේ නාම ලේඛන වෙන් වෙන් වශයෙන් ඇමුණුම 02 (B) ආකෘතියට අනුකූල ව මුළු ලකුණු අවරෝහණ අනුපිළිවෙළට සකස් කළ යුතු ය. එම ආකෘතිය (දෘඩ හා මෘදු පිටපත්) සමඟ එහි ඇතුළත් අයදුම්කරුවන්ගේ අයදුම්පත් හා සහතිකවල පිටපත් අනුපිළිවෙළින් සකස් කර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතු ය.

ඊට අමතරව ලකුණු 15 ට අඩු ලකුණු ලබා ගන්නා ලද අයදුම්කරුවන්ගේ නාමලේඛනය ද අමුණුම 02(B) ආකෘතියට අනුව මුළු ලකුණු අවරෝහණ අනුපිළිවෙලට වෙනම සකස්කර පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

VII. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු විසින් තෝරාගෙන කලාප අධ්‍යාපන කාර්යාල වෙත යොමුකරන ශිෂ්‍යත්වලාභීන් සුභග ශිෂ්‍යත්වය ලැබීමට සුදුසුකම් ලබන අතර පාසල්වල විදුහල්පතිවරු මඟින් සිසුන් දැනුවත්කර ඔවුන්ගේ බැංකු ගිණුම්වල (ලංකා බැංකු හෝ මහජන බැංකු) තොරතුරු බැංකු පොතෙහි සහතික කරන ලද පිටපත් සමඟ ඇමුණුම 03 මඟින් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය.

VIII. කලාප අධ්‍යාපන කාර්යාලයට අයත් පාසල්වල සුභග ශිෂ්‍යත්වධාරීන් සඳහා ශිෂ්‍යත්ව වාරික මුදල් කලාප අධ්‍යාපන කාර්යාලය විසින් ශිෂ්‍යත්වධාරීන්ගේ බැංකු ගිණුම්වලට සෘජුවම ප්‍රේෂණය කළ යුතුය.

5.3 පළාත් මට්ටම

I. පළාත් මට්ටමේදි සුභග ශිෂ්‍යත්ව වැඩසටහන සම්බන්ධීකරණය සඳහා මාණ්ඩලික නිලධාරියෙකු පත් කිරීමට පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් කටයුතු කළ යුතුය.

II. මෙම චක්‍රලේඛයේ ඇමුණුම 02(B) ආකෘතියට අනුව ඒ ඒ කාලාප අධ්‍යාපන කාර්යාල වලින් ලැබෙන අයදුම්පත් හා අදාළ සහතික/ ලේඛන පත්කරන ලද සම්බන්ධීකරණ නිලධාරියාගේ සම්බන්ධීකරණයෙන් පහත පරිදි පරික්ෂා කළ යුතුය.

III. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අධීක්ෂණයෙන් ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියකුගේ සභාපතිත්වයෙන් හා තවත් මාණ්ඩලික නිලධාරීන් දෙදෙනෙකුගේ සාමාජිකත්වයෙන් යුත් (තිදෙනකුගෙන් සමන්විත) සමාන්තර පළාත් තේරීම් කමිටු පිහිටුවා අයදුම්පත් පරීක්ෂා කර ප්‍රදානය කරන ලකුණු අයදුම්පතෙහි ලකුණු තීරුව 03හි සඳහන් කළ යුතු ය.

IV. පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව 150කට වඩා සැලකිය යුතු සංඛ්‍යාවක් ඉක්ම වූ අවස්ථාවකදී පමණක් අයදුම්පත් පරික්ෂා කිරීමේ කඩිනම් බව, නිරවද්‍ය බව හා පහසුව සලකා සුදුසු පරිදි කමිටු එකකට වඩා පත්කර ගත හැකිය. එසේ වුව ද අධ්‍යාපන අමාත්‍යාංශය වෙත තෝරා ගත් සිසුන්ගේ නාම ලේඛන යොමු කිරීමේ දී පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අදාළ කමිටු මඟින් තෝරා ගත් ශිෂ්‍ය නාම ලේඛන නිරවද්‍ය බවට සහතික කළ යුතු ය.

V. ඒ ඒ පළාත් අනුව චක්‍රලේඛානුකූලව එක් කාණ්ඩයකින් ඉහළ ම ලකුණු ලබා ගත් සිසුන් තෝරා ගත යුතු අතර කාණ්ඩ තුනෙන්ම සම සමව සිසුන් තෝරා ගැනීමට කටයුතු කළ යුතු ය. යම් කාණ්ඩයකින් නියමිත සංඛ්‍යාව සපුරා නොමැති නම් පමණක් අනෙකුත් කාණ්ඩ යටතේ එම සංඛ්‍යාව සමානුපාතික ව බෙදෙන පරිදි මුළු ශිෂ්‍ය සංඛ්‍යාව තෝරා ගත යුතු ය.

වගු අංක 01 : එක් එක් පළාත සඳහා වෙන් කර ඇති ශිෂ්‍යත්ව සංඛ්‍යාව

| පළාත | **ලබා දෙනු ලබන මුළු ශිෂ්‍යත්ව සංඛ්‍යාව** |
|---|---|
| බස්නාහිර | 200 |
| මධ්‍යම | 135 |
| දකුණ | 125 |
| වයඹ | 125 |
| සබරගමුව | 95 |
| නැගෙනහිර | 90 |
| උතුරු මැද | 70 |
| ඌව | 70 |
| උතුර | 65 |

VI. ඒ අනුව, පළාත් මට්ටමින් තෝරා ගත් ශිෂ්‍යත්ව ලාභීන්ගේ නාම ලේඛන ඇමුණුම 04 ආකෘතියට අනුකූල ව සකස් කළ යුතු ය. එම ආකෘතියෙහි දෘඪ හා මෘදු පිටපත් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කර අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් කටයුතු ශාඛාවේ අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කර අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතුය.

VII. ශිෂ්‍යත්වධාරීන්ගේ නාම ලේඛනවලට අනුමැතිය ලද පසු ඒ පිළිබඳව අදාළ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ දැනුවත් කළ යුතුය.

VIII. එසේම ඒ සමඟ පළාත් මට්ටමින් තෝරා ගනු ලබන ශිෂ්‍යත්වධාරීන්ට ශිෂ්‍යත්ව වාරික ගෙවීමට අවශ්‍ය ප්‍රතිපාදන පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙතින් ඉල්ලීම් කළ යුතුය.

IX. පළාතේ එක් එක් කලාපයෙන් තේරී ඇති ශිෂ්‍යත්වධාරීන් සඳහා හිමි ශිෂ්‍යත්ව වාරික මුදල් ගෙවීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් කලාප අධ්‍යාපන කාර්යාල වෙත ගබා දිය යුතුය.

5.4 ජාතික මට්ටම

I. සෑම වර්ෂයකදී ම අයදුම්පත් කැඳවීමට අදාළ උපදෙස් ලිපිය අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් වෙත නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.

II. පළාත් මට්ටමින් යොමු කරනු ලබන ශිෂ්‍යත්වධාරීන්ට අමතරව ජාත්‍යන්තර මට්ටමෙන් සුවිශේෂ දක්ෂතා දක්වන ලද සිසුන් සඳහා ද අධ්‍යාපන අමාත්‍යාංශයේ විශේෂ අනුමැතිය මත ශිෂ්‍යත්ව ලබා දෙනු ලැබේ.

III. පළාත් මට්ටමින් යොමුකරන ශිෂ්‍යත්වධාරීන් සංඛ්‍යාවට ශිෂ්‍යත්ව වාරික ගෙවීමට ප්‍රමාණවත් ප්‍රතිපාදන අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට පැවරිය යුතුය.

5.5 **ශිෂ්‍යයකු/ ශිෂ්‍යාවක කාණ්ඩ කිහිපයකින් ශිෂ්‍යත්වය සඳහා ඉල්ලුම් කළ ද එක් කාණ්ඩයකින් පමණක් මෙම ශිෂ්‍යත්වය ලැබීම සඳහා හිමිකම් ලබනු ඇත.**

**06. තෝරා ගැනීම සඳහා උපයෝගී කර ගන්නා කාණ්ඩ, නිර්ණායක හා අදාළ ලකුණු පටිපාටිය**

4.4 හි සඳහන් පරිදි කාණ්ඩ 03ක් සඳහා එනම්, නව නිපැයුම්, ක්‍රීඩා හා සෞන්දර්ය යන කාණ්ඩ පදනම් කර ගෙන විශේෂ නිර්ණායක හා පොදු නිර්ණායක යටතේ ලකුණු ලබා දීම සිදු කරයි.

මෙහි දී, ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක අදාළ වර්ෂයට ආසන්න අනුයාත වර්ෂ 4ක් තුළ දී ලබා ගත් ජයග්‍රහණ පමණක් සලකා බැලිය යුතු අතර විශේෂ නිර්ණායක යටතේ ලකුණු ලබා ඇති සිසුන් පමණක් ශිෂ්‍යත්වය සඳහා සුදුසුකම් ලබයි

**I. විශේෂ නිර්ණායක - උපරිම ලකුණු 60**

මේ යටතේ ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක පහත සඳහන් ක්ෂේත්‍රවලින් එක් ක්ෂේත්‍රයක් සඳහා පමණක් දක්වන ලද දක්ෂතා ඇගයීමට ලක් කළ යුතු ය.

අ) නව නිපැයුම් සඳහා ලබා ගත් ජයග්‍රහණ

ආ) සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ

ඇ) ක්‍රීඩා සඳහා ලබා ගත් ජයග්‍රහණ

**II. පොදු නිර්ණායක I කොටස - උපරිම ලකුණු 15**

ශිෂ්‍යයෙකු/ශිෂ්‍යාවක තමන් අයදුම් කරන කාණ්ඩය හැර අනෙක් කාණ්ඩයක් යටතේ දක්වා ඇති දක්ෂතා අදාළ පරිදි පොදු නිර්ණායක 01 යටතේ සඳහන් නිර්ණායක මඟින් ඇගයීමට ලක් කළ යුතු ය.

මෙහි දී, අයදුම් කරනු ලබන කාණ්ඩයට අදාළ විශේෂ නිර්ණායකය සඳහා ලකුණු ලබා නොදිය යුතු ය.

අ) නව නිපැයුම් කාණ්ඩය (කාණ්ඩ අංක 01) යටතේ අයදුම් කළ සිසුන් සඳහා

- සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ / ක්‍රීඩා සඳහා ලබා ගත් ජයග්‍රහණ

ආ) සෞන්දර්ය කාණ්ඩය (කාණ්ඩ අංක 02) යටතේ අයදුම් කළ සිසුන් සඳහා

- නව නිපැයුම් සඳහා ලබා ගත් ජයග්‍රහණ/ ක්‍රීඩා සඳහා ලබා ගත් ජයග්‍රහණ

ඇ) ක්‍රීඩා කාණ්ඩය (කාණ්ඩ අංක 03) යටතේ අයදුම් කළ සිසුන් සඳහා

- නව නිපැයුම් සඳහා ලබා ගත් ජයග්‍රහණ /සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ

## III. පොදු නිර්ණායක II කොටස - උපරිම ලකුණු 25

ශිෂ්‍යයකු/ශිෂ්‍යාවක පහත සඳහන් ක්ෂේත්‍ර සඳහා පෙන්වා ඇති දක්ෂතා පොදු නිර්ණායක II යටතේ ඇගයීමට ලක් කළ යුතු ය.

අ) අන්තර් ජාතික මට්ටමේ දක්ෂතා

ආ) විෂය සමගාමී ක්‍රියාකාරකම්

ඇ) භාෂා, ගණිතය, විද්‍යාව ඇතුළු අනෙකුත් විෂයයන් ආශ්‍රිත ක්‍රියාකාරකම්

ඈ) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්‍රියාකාරකම්

ඉ) අ.පො.ස.(උ.පෙළ)ට ඇතුළත් වීමට අදාළ අ.පො.ස.(සා.පෙළ) ප්‍රතිඵල

එක් එක් කාණ්ඩය යටතේ ඇති නිර්ණායක සඳහා ලබා දිය යුතු ලකුණු සාරාංශය වගු අංක 02හි සඳහන් කර ඇති අතර අදාළ ලකුණු ලබා දීමේ පටිපාටිය පහත 6.1 හා 6.2 යටතේ දක්වා ඇත.

**වගු අංක 02: නිර්ණායක සඳහා ලබා දිය යුතු ලකුණු**

| නිර්ණායක | කාණ්ඩ අංක 01 | කාණ්ඩ අංක 02 | කාණ්ඩ අංක 03 |
|---|---|---|---|
| **විශේෂ නිර්ණායක (උපරිම ලකුණු 60)** | නව නිපැයුම් සඳහා ලබා ගත් ජයග්‍රහණ (ලකුණු 60) | සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ (ලකුණු 60) | ක්‍රීඩා සඳහා ලබා ගත් ජයග්‍රහණ (ලකුණු 60) |
| **පොදු නිර්ණායක I (උපරිම ලකුණු 15)** | i. සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ (ලකුණු 15) | i. නව නිපැයුම් සඳහා ලබා ගත් ජයග්‍රහණ (ලකුණු 15) | i. නව නිපැයුම් සඳහා ලබා ගත් ජයග්‍රහණ (ලකුණු 15) |
| | ii. ක්‍රීඩා සඳහා ලබා ගත් ජයග්‍රහණ (ලකුණු 15) | ii. ක්‍රීඩා සඳහා ලබා ගත් ජයග්‍රහණ (ලකුණු 15) | ii. සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ (ලකුණු 15) |
| **පොදු නිර්ණායක II (උපරිම ලකුණු 25)** | iii. අන්තර්ජාතික මට්ටමේ දක්ෂතා (ලකුණු 05) | iii. අන්තර්ජාතික මට්ටමේ දක්ෂතා (ලකුණු 05) | iii. අන්තර්ජාතික මට්ටමේ දක්ෂතා (ලකුණු 05) |
| | iv. විෂය සමගාමී ක්‍රියාකාරකම් (ලකුණු 05) | iv. විෂය සමගාමී ක්‍රියාකාරකම් (ලකුණු 05) | iv. විෂය සමගාමී ක්‍රියාකාරකම් (ලකුණු 05) |

| | | | |
|---|---|---|---|
| | v. භාෂා,ගණිතය, විද්‍යාව ඇතුළු අනෙකුත් විෂයයන් ආශ්‍රිත ක්‍රියාකාරකම් (ලකුණු 05) | v. භාෂා,ගණිතය, විද්‍යාව ඇතුළු අනෙකුත් විෂයයන් ආශ්‍රිත ක්‍රියාකාරකම් (ලකුණු 05) | v. භාෂා,ගණිතය, විද්‍යාව ඇතුළු අනෙකුත් විෂයයන් ආශ්‍රිත ක්‍රියාකාරකම් (ලකුණු 05) |
| | vi. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්‍රියාකාරකම් (ලකුණු 05) | vi. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්‍රියාකාරකම් (ලකුණු 05) | vi. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්‍රියාකාරකම් (ලකුණු 05) |
| | vii. අ.පො.ස.(උ.පෙ.ළ) ට ඇතුළත් වීමට අදාළ අ.පො.ස (සා.පෙළ) ප්‍රතිඵල (ලකුණු 05) | vii. අ.පො.ස.(උ.පෙළ)ට ඇතුළත් විමට අදාළ අ.පො.ස (සා.පෙළ)ප්‍රතිඵල (ලකුණු 05) | vii. අ.පො.ස.(උ.පෙළ)ට ඇතුළත් විමට අදාළ අ.පො.ස (සා.පෙළ)ප්‍රතිඵල (ලකුණු 05) |
| | **මුළු ලකුණු 100** | **මුළු ලකුණු 100** | **මුළු ලකුණු 100** |

## 6.1 විශේෂ නිර්ණායක

### 6.1.1 කාණ්ඩ අංක 01 - නව නිපැයුම් සඳහා ලබා ගත් ජයග්‍රහණ

නව නිපැයුම් ආශ්‍රිතව දක්වා ඇති කුසලතා සඳහා පහත වගු අංක 03 පරිදි ලකුණු ප්‍රදානය කළ යුතු ය. මෙහි දී උපරිම ලකුණු ලද එක් අවස්ථාවක් පමණක් සලකා බැලිය යුතු ය.

**වගු අංක 03 : නව නිපැයුම් සඳහා ලකුණු ලබා දීම**

| අනු අංකය | තරගය | මට්ටම | ස්ථානය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | අන්තර්ජාතික තරගවලින් ප්‍රථම ස්ථාන | | | 60 |
| 02 | අන්තර්ජාතික තරගවලින් දෙවන හෝ තෙවන ස්ථාන | | | 50 |
| 03 | පේටන්ට් බලපත්‍ර ලබා තිබීම | | | 45 |
| 04 | නව නිපැයුම් (සමස්ත ලංකා පාසල් රොබෝ තාක්ෂණ හා නව නිර්මාණ තරඟාවලිය හා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මගින් ක්‍රියාත්මක කරන තරඟාවලියන්හි ඕනෑම තේමාවක ඕනෑම තරග අංශයක් සඳහා පමණි.) | ජාතික මට්ටම | 1 | 40 |
| 05 | | | 2 | 35 |
| 06 | | | 3 | 32 |
| 07 | | | කුසලතා | 30 |
| 08 | | | ඉදිරිපත් වීම | 28 |
| 09 | | පළාත් මට්ටම | 1 | 25 |
| 10 | | | 2 | 20 |
| 11 | | | 3 | 15 |
| 12 | | | ඉදිරිපත් වීම | 12 |
| 13 | | කලාප මට්ටම | 1 | 10 |
| 14 | | | 2 | 08 |
| 15 | | | 3 | 04 |

**උපරිම ලකුණු 60**

### 6.1.2 කාණ්ඩ අංක 02 - සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ

සමස්ත ලංකා සෞන්දර්ය තරගවලින් අදාළ වර්ෂයට ආසන්න අනුයාත වසර 4ක් තුළ දී වගු අංක 04හි සඳහන් පරිදි උපරිම වශයෙන් කේවල හා /හෝ කණ්ඩායම් තරග සඳහා උපරිම ලකුණු ලද අවස්ථා තුනක් පමණක් සලකා බැලිය යුතු ය.

**වගු අංක 04: සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලකුණු ලබා දීම**

| අනු අංකය | ඒකල/ සමූහ | මට්ටම | ස්ථානය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | ඒකල | අන්තර්ජාතික | 1 | 20 |
| 02 | | | 2 | 19 |
| 03 | | | 3 | 18 |
| 04 | | ජාතික | 1 | 17 |
| 05 | | | 2 | 15 |
| 06 | | | 3 | 13 |
| 07 | | පළාත් | 1 | 12 |
| 08 | | | 2 | 09 |
| 09 | | | 3 | 06 |
| 10 | සමූහ | අන්තර්ජාතික | 1 | 17 |
| 11 | | | 2 | 16 |
| 12 | | | 3 | 15 |
| 13 | | ජාතික | 1 | 13 |
| 14 | | | 2 | 12 |
| 15 | | | 3 | 10 |
| 16 | | පළාත් | 1 | 08 |
| 17 | | | 2 | 05 |
| 18 | | | 3 | 02 |

**උපරිම ලකුණු 60**

### 6.1.3. කාණ්ඩ අංක 03 -ක්‍රීඩා සඳහා ලබා ගත් ජයග්‍රහණ

සමස්ත ලංකා ක්‍රීඩා තරගවලින් අදාළ වර්ෂයට ආසන්න අනුයාත වසර 4ක් තුළ දී වගු අංක 05හි සඳහන් පරිදි උපරිම වශයෙන් කේවල හා /හෝ කණ්ඩායම් තරග සඳහා උපරිම ලකුණු ලද අවස්ථා තුනක් පමණක් සලකා බැලිය යුතු ය.

**වගු අංක 05: ක්‍රීඩා ජයග්‍රහණ සඳහා ලකුණු ලබා දීම**

| අනු අංකය | කේවල/කණ්ඩායම් | මට්ටම | ස්ථානය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | කේවල | අන්තර්ජාතික | 1 | 20 |
| 02 | | | 2 | 19 |
| 03 | | | 3 | 18 |
| 04 | | ජාතික | 1 | 17 |
| 05 | | | 2 | 15 |
| 06 | | | 3 | 13 |
| 07 | | පළාත් | 1 | 12 |
| 08 | | | 2 | 09 |

| | | | | |
|---|---|---|---|---|
| 09 | | | 3 | 06 |
| 10 | කණ්ඩායම් | අන්තර්ජාතික | 1 | 17 |
| 11 | | | 2 | 16 |
| 12 | | | 3 | 15 |
| 13 | | ජාතික | 1 | 13 |
| 14 | | | 2 | 12 |
| 15 | | | 3 | 10 |
| 16 | | පළාත් | 1 | 08 |
| 17 | | | 2 | 05 |
| 18 | | | 3 | 02 |

**උපරිම ලකුණු 60**

## 6.2 පොදු නිර්ණායක -

### 6.2.1 පොදු නිර්ණායක I කොටස

#### 6.2.1.1 නව නිපැයුම් සඳහා ලබා ගත් ජයග්‍රහණ

නව නිපැයුම් ආශ්‍රිතව දක්වා ඇති කුසලතා අනුව පහත වගු අංක 06හි පරිදි එක් නිර්මාණයක් පමණක් සලකා බලා ලකුණු ප්‍රදානය කරනු ලැබේ.

වගු අංක 06 : නව නිපැයුම් සඳහා ලකුණු ලබා දීම (පොදු නිර්ණායක)

| අනු අංකය | තරගය | මට්ටම | ස්ථානය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | පේටන්ට් බලපත්‍ර ලබා තිබීම | | | 15 |
| 02 | නව නිපැයුම් (සමස්ත ලංකා පාසල් රොබෝ තාක්ෂණ හා නව නිර්මාණ තරඟාවලිය හා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මගින් ක්‍රියාත්මක කරන තරගාවලියන්හි ඕනෑම තේමාවක ඕනෑම තරග අංශයක් සඳහා පමණි.) | ජාතික මට්ටම | 1 | 14 |
| 03 | | | 2 | 13 |
| 04 | | | 3 | 12 |
| 05 | | | කුසලතා | 11 |
| 06 | | | ඉදිරිපත් වීම | 10 |
| 07 | | පළාත් මට්ටම | 1 | 09 |
| 08 | | | 2 | 08 |
| 09 | | | 3 | 07 |
| 10 | | | ඉදිරිපත් වීම | 06 |
| 11 | | කලාප මට්ටම | 1 | 05 |
| 12 | | | 2 | 04 |
| 13 | | | 3 | 03 |

**උපරිම ලකුණු 15**

#### 6.2.1.2 සෞන්දර්ය ක්‍රියාකාරකම් සඳහා ලබා ගත් ජයග්‍රහණ-

සමස්ත ලංකා සෞන්දර්ය තරගවලින් ජාතික/ පළාත් මට්ටමින් ඒකල හෝ සමූහ තරග සඳහා අදාළ වර්ෂයට ආසන්න අනුයාත වසර 4ක් තුළ දී ලත් එක් ජයග්‍රහණයක් පමණක් සලකා බැලිය යුතු ය.

**වගු අංක 07: සෞන්දර්ය ජයග්‍රහණ සඳහා ලකුණු ලබා දීම**

| අනු අංකය | තරගය | මට්ටම | ස්ථානය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | ඒකල | ජාතික | 1 | 15 |
| 02 | | | 2 | 14 |
| 03 | | | 3 | 13 |

| | | | | |
|---|---|---|---|---|
| 04 | | පළාත් | 1 | 12 |
| 05 | | | 2 | 11 |
| 06 | | | 3 | 10 |
| 07 | | කලාප | 1 | 8 |
| 08 | | | 2 | 7 |
| 09 | | | 3 | 6 |
| 10 | සමූහ | ජාතික | 1 | 12 |
| 11 | | | 2 | 11 |
| 12 | | | 3 | 10 |
| 13 | | පලාත් | 1 | 8 |
| 14 | | | 2 | 7 |
| 15 | | | 3 | 6 |
| 16 | | කලාප | 1 | 4 |
| 17 | | | 2 | 3 |
| 18 | | | 3 | |

**උපරිම ලකුණු 15**

### 6.2.1.3. ක්‍රීඩා සඳහා ලබා ගත් ජයග්‍රහණ

සමස්ත ලංකා මට්ටමේ ක්‍රීඩා තරගවලින් උපරිම වශයෙන් එක් කේවල හා /හෝ කණ්ඩායම් තරගයක් පමණක් සලකා බලන අතර අදාළ වර්ෂයට ආසන්න අනුයාත වසර 4ක් තුළ දී ලබා ගත් ජයග්‍රහණ පමණක් සලකා බලා වගු අංක 08ට අනුව ලකුණු ලබා දෙනු ලැබේ.

**වගු අංක 08: ක්‍රීඩා සඳහා ලකුණු ලබා දීම (පොදු නිර්ණායක)**

| අනු අංකය | තරගය | මට්ටම | ස්ථානය | ලකුණු |
|---|---|---|---|---|
| 01 | කේවල | ජාතික | 1 | 15 |
| 02 | | | 2 | 14 |
| 03 | | | 3 | 13 |
| 04 | | පළාත් | 1 | 12 |
| 05 | | | 2 | 11 |
| 06 | | | 3 | 10 |
| 07 | | කලාප | 1 | 8 |
| 08 | | | 2 | 7 |
| 09 | | | 3 | 6 |
| 10 | කණ්ඩායම් | ජාතික | 1 | 12 |
| 11 | | | 2 | 11 |
| 12 | | | 3 | 10 |
| 13 | | පලාත් | 1 | 8 |
| 14 | | | 2 | 7 |
| 15 | | | 3 | 6 |
| 16 | | කලාප | 1 | 4 |
| 17 | | | 2 | 3 |
| 18 | | | 3 | 2 |

**උපරිම ලකුණු 15**

## 6.2.2 පොදු නිර්ණායක II කොටස

### 6.2.2.1 වෙනත් ක්ෂේත්‍රයකින් ලබා ඇති /දක්වන ලද අන්තර්ජාතික මට්ටමේ දක්ෂතා

ඉල්ලුම් කරනු ලබන කාණ්ඩයට අමතර වශයෙන් සහභාගි වූ එක් තරගයක්/ ක්‍රියාකාරකමක් පමණක් මේ යටතේ සලකා බැලිය යුතු ය.

| | | |
|---|---|---|
| පළමු ස්ථානය /රන් පදක්කම | - | ලකුණු 05 |
| දෙවනස්ථානය/රිදී පදක්කම | - | ලකුණු 03 |
| තෙවනස්ථානය/ලෝකඩ පදක්කම | - | ලකුණු 02 |
| සහභාගිත්වය | - | ලකුණු 01 |

**උපරිම ලකුණු 05**

### 6.2.2.2 විෂය සමගාමී ක්‍රියාකාරකම්

පහත සඳහන් විෂය සමගාමී ක්‍රියාකාරකම් පමණක් මේ යටතේ සලකා බැලිය යුතු ය.

**වගු අංක 09: විෂය සමගාමී ක්‍රියාකාරකම් සඳහා ලකුණු ලබා දීම**

| ක්‍රියාකාරකම | ලබා ඇති පදක්කම | ලකුණු |
|---|---|---|
| බාලදක්ෂ/ බාලදක්ෂිකා | ජනාධිපති බාලදක්ෂ පදක්කම | 5 |
| | වන වාසියාගේ රූහැන/නාවිකයාගේ පදක්කම/ගුවන් භට පදක්කම ලබා තිබීම / පළමු පෙළ සාර්ථක ව නිම කළ බාලදක්ෂිකාවක් වීම | 4 |
| | දිසා කොමසාරිස් ප්‍රදානය /දෙවන පෙළ සාර්ථක ව නිම කළ බාලදක්ෂිකාවක් වීම | 2 |
| | බාලදක්ෂයෙකු/බාලදක්ෂිකාවක වීම | 1 |
| ශිෂ්‍යභට | බලලත් නිලධාරි 1 | 5 |
| | බලලත් නිලධාරි 2/ මාණ්ඩලික සැරයන්/සැරයන් | 4 |
| | කෝප්‍රල් | 3 |
| | ලාන්ස් කෝප්‍රල් | 2 |
| | ශිෂ්‍ය භට | 1 |
| පරිසර නියමු | ජනාධිපති පදක්කම | 5 |
| | ස්වර්ණ වර්ණ පදක්කම | 4 |
| | රජත පදක්කම | 3 |
| | හරිත පදක්කම | 2 |
| | පරිසර භට | 1 |

**උපරිම ලකුණු 05**

### 6.2.2.3 භාෂා, ගණිතය, විද්‍යාව ඇතුළු අනෙකුත් විෂයයන් ආශ්‍රිත ක්‍රියාකාරකම්

අධ්‍යාපන අමාත්‍යාංශය හා සම්බන්ධ ව සමස්ත ලංකා මට්ටමේ ක්‍රියාත්මක කරනු ලබන නිර්මාණශීලීත්වය හා තාර්කික චින්තනය පදනම් වූ කාව්‍ය රචනා, කෙටි කථා, රචනා, විවාද, කථික, ගණිත හා විද්‍යා ඔලිම්පියාඩ් වැනි ක්‍රියාකාරකම් /තරග මෙහි දී සලකා බැලිය යුතු ය. එමෙන් ම අදාළ වර්ෂයට ආසන්න අනුයාත වසර 4ක් තුළ දී ලබා ගත් ජයග්‍රහණයක් පමණක් සලකා බලා වගු අංක 10 අනුව ලකුණු ලබා දිය යුතු ය.

වගු අංක 10: භාෂා, ගණිතය, විද්‍යාව ඇතුළු අනෙකුත් විෂයයන් සඳහා ලකුණු ලබා දීම

| ස්ථානය | ලබා දෙන ලකුණු |
|---|---|
| 1 | 5 |
| 2 | 3 |
| 3 | 2 |

**උපරිම ලකුණු 05**

### 6.2.2.4 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්‍රියාකාරකම්

අධ්‍යාපන අමාත්‍යාංශයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ශාඛාවේ සම්බන්ධීකරණය ඇති ව සමස්ත ලංකා මට්ටමේ ක්‍රියාත්මක කරන ලද මෘදුකාංග නිර්මාණය, වෙබ් අඩවි නිර්මාණය ආදි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්ෂේත්‍රයට අදාළ තරග මෙහි දී සලකා බැලිය යුතු ය.

වගු අංක 11: තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ක්‍රියාකාරකම් සඳහා ලකුණු ලබා දීම

| ස්ථානය | ලබා දෙන ලකුණු |
|---|---|
| 1 | 5 |
| 2 | 3 |
| 3 | 2 |

**උපරිම ලකුණු 05**

### 6.2.2.5.අ.පො.ස.(උ.පෙළ)ට ඇතුළත් වීමට අදාළ අ.පො.ස.(සා.පෙළ) ප්‍රතිඵල

වගු අංක 12: අ.පො.ස.(සා.පෙළ) ප්‍රතිඵල සඳහා ලකුණු ලබා දීම.

| | |
|---|---|
| විෂයන් නවයටම A සාමාර්ථ සහිතව සා.පෙළ සමත්වීම | ලකුණු 5 |
| ඕනෑ ම විෂයන් 6ත් -8ත් අතර සංඛ්‍යාවක් සඳහා A සාමාර්ථ සහිතව සා.පෙළ සමත්වීම | ලකුණු 4 |
| ඕනෑ ම විෂයන් 4ත් -5ත් අතර සංඛ්‍යාවක් සඳහා A සාමාර්ථ සහිතව සා.පෙළ සමත්වීම | ලකුණු 3 |
| ඕනෑ ම විෂයන් 1ත් -3ත් අතර සංඛ්‍යාවක් සඳහා A සාමාර්ථ සහිතව සා.පෙළ සමත්වීම | ලකුණු 2 |
| සම්මාන සාමාර්ථ 3 ක් සහිත ව සා.පෙළ සමත්වීම | ලකුණු 1 |

**උපරිම ලකුණු 05**

**මුළු ලකුණු 100**

## 6.3 සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමේදී අවධානය යොමු කළ යුතු කරුණු

6.3.1 ජාත්‍යන්තර තරග සඳහා ලකුණු ලබා දීමේදී පිළිගත් අන්තර්ජාතික හෝ කලාපීය සංවිධාන මඟින් පවත්වන ලද තරග සලකා බැලිය යුතු ය.

6.3.2 නව නිපැයුම් සඳහා ලබා ගත් ජයග්‍රහණ සලකා බැලීමේදී අධ්‍යාපන අමාත්‍යාංශය, ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය, නව නිපැයුම් කරුවන්ගේ කොමිසම, ජාතික විද්‍යා පදනම හෝ රාජ්‍ය විශ්ව විද්‍යාල මගින් පවත්වන ලද තරගවලින් ලබා ගත් ජයග්‍රහණ පමණක් සලකා බැලිය යුතු ය.

6.3.3 සෞන්දර්ය කාණ්ඩය යටතේ අයදුම් කර ඇති සිසුන් තෝරා ගැනීමේ දී අධ්‍යාපන අමාත්‍යාංශයේ සෞන්දර්ය ශාඛාව මගින් මෙහෙයවන ලද සමස්ත ලංකා සෞන්දර්ය තරග අදාළ කර ගත යුතු ය. නාට්‍ය තරග සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය,සංස්කෘතික කටයුතු දෙපාර්ත්මේන්තුව,ටවර් හෝල් පදනම ආදී ආයතන මෙහෙයවනු ලබන රාජ්‍ය ළමා නාට්‍ය උළෙල,සමස්ත ලංකා පාසල් නාට්‍ය තරගය, සමස්ත ලංකා පාසල් නාට්‍ය හා රංග කලා උළෙල යන තරගවල හොඳම නළුවා/නිළිය, හොඳම සහාය නළුවා/ සහාය නිළිය, හොඳම භූමිකා රංගනය ඉදිරිපත් කළ ශිෂ්‍යයා/ශිෂ්‍යයාව පළමු,දෙවන හා තෙවන ස්ථානය පමණක් සලකා බැලිය යුතු ය.

6.3.4 ක්‍රීඩා කාණ්ඩය යටතේ අයදුම් කර ඇති සිසුන් තෝරා ගැනීමේ දී අධ්‍යාපන අමාත්‍යාංශයේ ක්‍රීඩා ශාඛාව,පාසල් ක්‍රීඩා සංගම්, ජාතික ක්‍රීඩා සංගම්,ක්‍රීඩා අමාත්‍යාංශය මගින් පවත්වන ලද තරගවලින් ලබා ගත් ජයග්‍රහණ පමණක් සලකා බැලිය යුතු ය.

## 07. ශිෂ්‍යත්ව ප්‍රදානය

7.1 ද්විතියික අධ්‍යාපන අවධියේ සුවිශේෂ දක්ෂතා ප්‍රදර්ශනය කළ හා අදාළ වර්ෂයේ 12 වන ශ්‍රේණියට ඇතුළත් ව අ.පො.ස.(උසස් පෙළ) අධ්‍යාපනය ආරම්භ කරන සිසුන් අතරින් තෝරා ගත් සිසුන්ට අ.පො.ස. (උ.පෙළ) ඉගෙනුම ලබන අවුරුදු 2ක කාල සීමාව තුළ එක් මාසයකට රු.2500/= බැගින් ශිෂ්‍යත්ව වාරික 20ක් ලබා දෙනු ලැබේ. අදාළ මුදල ශිෂ්‍යත්වලාභියාගේ නමට විවෘත කරනු ලබන ලංකා බැංකුවේ හෝ මහජන බැංකුවේ බැංකු ගිණුමකට කලාප අධ්‍යාපන කාර්යාලය විසින් සෘජුව ම ප්‍රේෂණය කළ යුතුය.

7.2 එසේ ශිෂ්‍යත්ව මුදල් බැංකුගත කිරීමේ දී රු. 50,000ක සමස්ත ශිෂ්‍යත්ව මුදල රු 25,000 බැගින් වාර දෙකකදී ගිණුම්ගත කළ යුතුය. එමෙන්ම පළමුවර ශිෂ්‍යත්ව මුදල් ගිණුම්ගත කිරීමෙන් පසු ශිෂ්‍යත්වධාරියා අඛණ්ඩ අධ්‍යාපන කටයුතුවල නියැලීම පිළිබඳ පාසල් මගින් නියාමනය කිරීමෙන් පසු දෙවන වර ශිෂ්‍යත්ව මුදල් ගිණුම්ගත කිරීම සිදුකළ යුතුය.

7.3 මෙම ශිෂ්‍යත්වලාභීන් අඛණ්ඩ ව අධීක්ෂණය කිරීම සඳහා අදාළ පාසල මගින් සුදුසු ගුරුවරයෙකු පත් කළ යුතු අතර එම ගුරුභවතා ශිෂ්‍යත්වලාභියාට නිසි මඟපෙන්වීම සිදු කළ යුතු ය.

7.4 පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව මගින් මෙම ශිෂ්‍යත්වය සඳහා තෝරා ගත් සිසු සිසුවියන්ගේ නම් අදාළ පාසල වෙත දැනුම් දුන් පසු විදුහල්පති විසින් මෙම ශිෂ්‍යත්වලාභීන් අදාළ විදුහලේ අඛණ්ඩව ඉගෙනුම ලබන බවට හා ශිෂ්‍යත්වය ලබා දීම යෝග්‍ය බව තහවුරු කෙරෙන ලිපියක් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂට ද පිටපතක් සහිත ව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලබා දීමට කටයුතු කළ යුතු වේ. ඉන් පසු ශිෂ්‍යත්ව ප්‍රදානය සිදු කරන අදාළ කාල සීමාව තුළ දී ද අදාළ ශිෂ්‍යත්වලාභියා එම පාසලේ අඛණ්ඩ ව අධ්‍යාපනය ලබන බවට ලිපියක් වාර්ෂිකව විදුහල්පති විසින් පළාත්

අධ්‍යාපන අධ්‍යක්ෂට පිටපතක් සහිතව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලබා දීමට කටයුතු කළ යුතු වේ.

7.5 අදාළ ශිෂ්‍යත්වලාභියා යම් හේතුවක් නිසා ඉගෙනුම ලබන පාසලෙන් ඉවත් ව වෙනත් පාසලකට ඇතුළත් ව ඇත්නම්, ඒ බව තහවුරු කෙරෙන ලිපියක් විදුහල්පති විසින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂට පිටපතක් සහිත ව කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතු ය.

**08. ශිෂ්‍යත්ව නියාමනය**

I. කලාප මට්ටමින් ශිෂ්‍යත්වලාභීන් නියාමනය කිරීම ඔවුන් ඉගෙනුම ලබන පාසල අයත් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සිදුකළ යුතුය. ඒ සඳහා සුභග ශිෂ්‍යත්ව සම්බන්ධීකරණ නිලධාරියාට අදාල වගකීම පැවරිය යුතුය.

II. පළාත් මට්ටමින් ශිෂ්‍යත්වලාභීන් නියාමනය කිරීම අදාල පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සිදුකළ යුතු අතර ඒ සම්බන්ධ වගකීම සුභග ශිෂ්‍යත්ව සම්බන්ධීකරණ නිලධාරියාට පැවරිය යුතුය.

III. ජාතික මට්ටමින් ශිෂ්‍යත්වලාභීන් නියාමනය කිරීම අවශ්‍ය අවස්ථාවලදී අධ්‍යාපන අමාත්‍යාංශයේ පාසල් කටයුතු ශාඛාව මඟින් සිදු කරනු ඇත.

**09. ශිෂ්‍යත්වය අවලංගු විය හැකි අවස්ථා**

9.1 පහත සඳහන් අවස්ථා හා හේතු පිළිබඳ සලකා බලා චක්‍රලේඛ අනුව සුභග ශිෂ්‍යත්වලාභීන්ට ලබාදෙන ශිෂ්‍යත්ව අවලංගු කිරීමේ බලය අධ්‍යාපන ලේකම් සතු වේ.

I. ශිෂ්‍යත්වලාභියා විනය විරෝධී හැසිරීම සඳහා දඬුවම් ලැබීම.

II. අඛණ්ඩ ව පාසලට නොපැමිණීම.

III. අඛණ්ඩ අධ්‍යාපන කටයුතුවලින් බැහැර වීම.

IV. අ.පො.ස.(උ.පෙළ) අධ්‍යාපනය සම්පූර්ණ නොකර පාසලෙන් ඉවත් වීම.

මෙම චක්‍රලේඛයෙන් පැන නගින කිසියම් ගැටලුවක් ඇත්නම් ඒ සම්බන්ධයෙන් අධ්‍යාපන ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

එම්.එන්. රණසිංහ
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය

පිටපත - විගණකාධිපති - විගණකාධිපති දෙපාර්තමේන්තුව